# පෙරහුරු ප්‍රශ්න පත්‍රය - අංක 08

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ**
**සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2022**

EXAMINATION GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES - 2022

## II පත්‍රය

**පැය 01 මිනිත්තු 15**

**විභාග අංකය :** ..................................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.** (සමහර ප්‍රශ්නවල අනු කොටස් දී ඇත.)
- පිළිතුරු **තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට ඉරක් පමණක් අඳින්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |

**නිර්මාණය : නීතිඥ ශ්‍රේෂන් කුලරත්න, හිටපු අධ්‍යක්ෂ**
(මුල් ළමාවිය සංවර්ධන සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම)
0714-500044

1. පහත දැක්වෙන ඡේදය කියවන්න.

පොසොන් මාසය ළංවෙත්ම හේනේ වල් කෙටීම ඇරඹෙයි. එක් මසක් පමණ ගතවන විට අක්කර දෙක තුනක් කොටා ගැනීමට හේන් ගොවියෝ සමත් වෙති. නිකිණි මස සැඩ සුළං සහිත ය. මෙම කාලයේ කළ යුතු වැදගත්ම කාරිය හේන ගිනි තැබීම යි. හේන පුළුස්සා අවසන් වීමත් සමඟ වැට බැඳීම ආරම්භ වෙයි. ඔක්තෝබර්, නොවැම්බර් මාසවල වසින වර්ෂාව ගොවි සිත් සතුටු කරවයි.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.
  - (i) සැඩ සුළං සහිත කාලය කුමන මාසයේ යෙදේ ද? ..................................................
  - (ii) ගොවි සිත් සතුටු කරවන්නේ කුමකින් ද? ..................................................
  - (iii) ඡේදයේ සඳහන් විශේෂණ පදයක් තෝරා ලියන්න. ..................................................
  - (iv) ඡේදයෙන් සඳහන් ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා පදයක් සොයා ලියන්න. ..................................................
  - (v) ඡේදයට සුදුසු මාතෘකාවක් තෝරා ඉරක් අඳින්න.
    - (අ) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය
    - (ආ) ගොවියන්ගේ විනෝදාංශය
    - (ඇ) හේන් වගාව
  - (vi) සඤ්ඤක අකුරු වර්ග දෙකක් යෙදුණු වචන දෙකක් ලියන්න.
    (අ) .................................................. (ආ) ..................................................

2. පහත සඳහන් එක් එක් ප්‍රශ්නවල වචන අතුරෙන් අදාළ නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරාගෙන යටින් ඉරක් අඳින්න.
   - (i) පුස්ථකාලය / පුස්තකාලය / පුස්තකාළය
   - (ii) පළගැටියා / පලගැටියා / පළඟැටියා

3. පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.
   (i) ......................... - පිටි (ii) කෙළි - .......................

4. පහත සඳහන් වාක්‍යය නිවැරදි නම් " ✓ " ලකුණ ද වැරදි නම් "×" ලකුණද ඉදිරියේ තිබෙන හිස්තැන මත ලියන්න.
   - (i) දරුවෙකු ගී ගැයුවේ ය. ( )
   - (ii) ඔවුහු අනාගතය පිළිබඳ අදහස් දක්වති. ( )
   - (iii) ඔහු සැමට උදවු කළෝය. ( )

5. පහත සඳහන් වාක්‍යයේ උචිත ස්ථානවල විරාම ලකුණු යොදන්න.
   අයියෝ ඒක හරි ම ලේසියි

6. පහත සඳහන් යෙදුම් පැහැදිලි කරන්න.
   - (i) ඇඟ බේරා ගන්නවා ..................................................
   - (ii) හීන් දැඩිය දැම්මා ..................................................

[තුන්වැනි පිටුව බලන්න.]

**විභාග අංකය : ..................................................**

7. පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කර නැවත ලියන්න.
   .............................................. මිරිස් ගත්තා වගේ

8. පහත සඳහන් වචන සඳහා විරුද්ධාර්ථ පද ලියන්න.
   (i) ගැළපෙන - .....................................  (ii) ...................................... - අයහපත්

9. පහත සඳහන් වාක්‍ය වාචික බසින් ලියන්න.
   (i) අම්මා පොරවෙන් ගසක් කපන වා. ........................................................................
   (ii) ගොනා කුඹුරේ ගොයම් කනවා. ........................................................................

10. පහත සඳහන් වචන නිවැරදිව සංවිධානය කර අර්ථවත් වාක්‍යයක් ලියන්න.
   වූහ / නිරත / ඉගැන්වීම් / ගුරුවරු / කටයුතුවල / කැපවීමෙන්
   ..........................................................................................................................................

11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලියන්න.
   (i) tomato - ...............................  (ii) broom -.......................................

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති හිස්තැන මත ඉංග්‍රීසි අකුරෙන්ම ලියන්න.

   (i)  ..........................

   (2)  ..........................

13. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.
   (i) is / much/ it / How -.....................................................................................
   (ii) under / is / the / It / table -.....................................................................................

14. "ඉල්ලෙ" යන දෙමළ වචනයට අදළ සිංහල වචනය ලියන්න. ..........................................

15. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.
   "ශිෂ්‍යාව " ..................................................................................................................

16. මෙම සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.
   විසි හතර දහස් අනූ නවය .............................................

17. (i) පහත ගණක රාමුවෙහි නිරූපිත අගය ලියන්න........................
   (ii) පහත දී ඇති සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.
   2070, 1999, 9500, 34002,
   ...................................................................................................




[හතරවැනි පිටුව බලන්න.]

18. පහත දී ඇති සංඛ්‍යාවේ පෙර හා පසු සංඛ්‍යා ලියන්න.

..................., VIII, .....................



19. (i) පහත සඳහන් රූපයේ පාට කර තිබෙන කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. ............................

(ii) පාට නොකළ කොටස භාගයක් ලෙස ලියන්න.....................

20. පහත සඳහන් සංඛ්‍යා රටාවල හිස්තැනට ගැළපෙන සංඛ්‍යාවන් ලියන්න.

(i) 64, 72, ............, 88, 96      (i) .........., 36, 42, 48, 74

21. පහත සඳහන් වන්නේ ගොඩනැගිල්ලක සැලැස්මකි. එහි කාමරවල දිග දී ඇත.




22.

| | |
|---|---|
| 250 | 184 |
| 273 | |
| 264 | 197 |

කොටුව තුළ තිබෙන සංඛ්‍යා දෙකක් එකතු කළ විට 447 සංඛ්‍යාව ලැබේ. එම සංඛ්‍යා දෙක හිස්තැන මත ලියන්න. ..............., ...................

23. පහත සඳහන් රූපයේ සමමිතික රේඛා කොපමණ තිබේ ද?

...........................................................



24.



(i) මෙම ඝන වස්තුවේ නම කුමක් ද? ..................................

(ii) මෙහි දර සංඛ්‍යාව කොපමණ තිබේ ද? ............................

25. පහත සඳහන් රූපයේ ඇතුළත සෘජුකෝණ තිබෙන සංඛ්‍යාව ලියන්න. .......................................



26. කිතුල් පැණි නිෂ්පාදනය කර අලෙවි කරන පුද්ගලයෙකු පැණි ලීටර 5 මිලිලීටර 750 ක් මිලිලීටර 250 බැගින් කුඩා බෝතල්වලට දමන ලදී. ඒ අනුව සකස් කළ හැකි බෝතල් ගණන කොපමණ ද? ........................

27. (i) ළමයෙකු ගෙඩියක් රුපියල් 40.00 බැගින් අඹ ගෙඩි 8 ක් මිලට ගන්නා ලදී. මේ සඳහා ගිය මුළු වියදම කොපමණ ද? ..............................................

(ii) මෙ සඳහා ළමයා විසින් වෙළෙන්දට රුපියල් 500 ක නෝට්ටුවක් දෙන ලදී. ඒ අනුව ඔහුට ලැබෙන ඉතුරු මුදල කීයද? ......................................

28. 
8kg 600g


4kg 500g

මෙම මාලු දෙදෙනාගේ බරෙහි වෙනස කොපමණ ද? ....................................

29. පහත සඳහන් ප්‍රස්තාරයෙන් හා වගු සටහනෙන් දැක්වෙන්නේ නිවාස යෝජනා ක්‍රමයක තිබුණු නිවාස වර්ග පිළිබඳ තොරතුරු ය. එය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




| නිවාස වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| A | 12 |
| B | 6 |
| C | 8 |
| D | ........ |
| E | 10 |

(i) නිවාස වර්ග අතරින් මුළු සංඛ්‍යාවෙන් 1/3 ට අයත් නිවාස වර්ග දෙක කුමක් ද?
...............................................

(ii) D නිවාස ප්‍රමාණය 10 කි. එය වගුවේ සඳහන් කරන්න.

- ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයේ පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරාගෙන ඒ යටින් ඉරක් අඳින්න.

30. සුවඳ හමන මල් වර්ගයකි.
(1) සමන් පිච්ච (2) දස්පෙතියා (3) වද

31. පොඩි කළ විට සුවඳක් සහිත ශාක විශේෂයක් වන්නේ මින් කුමක් ද?
(1) කෙසෙල් (2) කතුරුමුරුංගා (3) කරපිංචා

32. ජලයේ වැඩෙන ශාක වර්ගයක් නොවන්නේ මින් කුමක් ද?
(1) හයිඩ්‍රිල්ලා (2) ජපන් ජබර (3) කුරුඳු

33. ශාක පත්‍රවලින් අලංකාරෙ නිවසක් පිළියෙල කර ගන්නා සතෙකි
(1) කඩියා (2) දිමියා (3) ලේනා

34. කාලගුණ අනාවැකි ප්‍රකාශ කරන සතෙකු නොවන්නේ,
(1) උකුස්සා (2) මෙරු (3) බල්ලා

35. වැසිකිලි කැසිකිලි පිරිසිදුව භාවිත නොකිරීමෙන් සිදුවන ගැටළු අතරට අයත් නොවන පිළිතුර කුමක් ද?
(1) තමාව අන් අයගේ අප්‍රසාදයට හා නොසැලකිල්ලට ලක්වීම.
(2) අන් අය වැසිකිලි කැසිකිලි භාවිතයට ප්‍රිය නොකිරීම.
(3) ජලය පරිස්සම් කර ගැනීමට හැකි වීම.

36. අනවශ්‍ය ලෙස ජලය අපතේ හැරීමෙන් ඇතිවිය හැකි අයහපත් ලක්ෂණ අතරට අදළ නොවන කරුණු වන්නේ,
(1) ජල හිඟයක් ඇති වීමට උදව් කිරීම.
(2) අන් අයගේ අපහාසයට හා උපහාසයට පාත්‍රවීම.
(3) තම පිරිසිදුකම හා නිරෝගිභාය ආරක්ෂා වීම.

37. ගසක් සිදුරු කිරීමට විශේෂ හැකියාවක් සහිත පක්ෂියෙකි.
(1) පිළිහුඩුවා (2) කොට්ටෝරුවා (3) වඩු කුරුල්ලා

38. සමනලයින් බිත්තර දැමීමට ප්‍රිය කරන ශාකයකි.
(1) කතුරුමුරුංගා (2) වතුසුද්ද (3) සියඹලා

39. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව
(1) 26 යි. (2) 25 යි. (3) 24 යි.

40. ශ්‍රී ලංකාවට ආසන්න විශාලම සාක් කලාපීය රට වන්නේ,
(1) ඇෆ්ගනිස්ථානය (2) ඉන්දියාව (3) බංගලිදේශය

41. කම්මල් කර්මාන්තයේදී රත් වූ යකඩයක් තැලීම සඳහා යොද ගන්නා උපකරණයකි.
(1) කිණිහිරය (2) මයිනහම (3) අඬුමිටිය

42. 
පහත සඳහන් උපකරණය භාවිත කරන කර්මාන්තය වන්නේ,
(1) ධීවර කර්මාන්තය
(2) පෙදරේරු කර්මාන්තය
(3) කුඹල් කර්මාන්තය

43. ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය වන්නේ මින් කුමක් ද?
(1) SIO (2) SLS (3) ISO

[හත්වැනි පිටුව බලන්න.]

44. "කඩිප්පුව" භාවිත කරමින් වාදනය කරන සංගීත භාණ්ඩයකි.
(1) දිග් බෙරය (2) දවුල (3) බුම්මැඩිය

45. ශරීරයට ශක්තිය ලබාදෙන ආහාර වර්ග දෙකක්.
(1) බත් සහ කඩල (2) පාන් සහ මාළු (3) කොස් සහ මඤ්ඤොක්කා

46. කණ්ඩායම් ක්‍රීඩාවක් වන්නේ මින් කුමක් ද?
(1) ඔලිඳ කෙළිය (2) හෙල්ලය විසි කිරීම (3) රිටි පැනීම

47. පුද්ගලයෙකු ආහාර ගැනීමේදී සැලකිළිමත් විය යුතු කරුණු අතරට අදාළ නොවන කරුණ කුමක් ද?
(1) ආහාර ගැනීමෙන් පසු ජලය වැඩි ප්‍රමාණයක් පානය කිරීම.
(2) මිශ්‍ර ආහාර වේලක් ගැනීම
(3) ආහාර වේල් නියමිත වේලාවකදී ගැනීම

48. මිනිස් මූලික අවශ්‍යතාවන් අතරට අදාළ නොවන කරුණ කුමක් ද?
(1) නිවාස (2) දුරකථන (3) ඇඳුම්

49. සමාජයක ජීවත් වීමේදී පවත්වා ගත යුතු ගුණාංග අතරට අදාළ නොවන කරුණකි.
(1) ලද දෙයින් සතුටුවීම
(2) බෙදා හදා ගැනීම
(3) තමා නිවැරදි යයි සිතන මතය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම

50. උණු ජලය ශරීරය මතට වැටී පිළිස්සුණු විටකදී ලබාදිය යුතු ප්‍රථමාධාරය වන්නේ කුමක් ද?
(1) පිළිස්සුණු ස්ථානය හොඳින් රෙදි කැබැල්ලකින් ආවරණය කිරීම
(2) ක්ෂණිකව අත් බෙහෙතක් දැමීම.
(3) සීතල ජලයට පිළිස්සුණු ස්ථානය ටික වේලාවක් හොඳින් අල්ලා සිටිමින් තෙමීම.

51. මදුරුවාගෙන් බෝවන රෝග අතරට අයත් වන්නේ මින් කුමක් ද?
(1) මහාමාරිය (2) පාචනය (3) මැලේරියාව

52. පහත සඳහන් විදුලි පන්දම් අතරින් දැල්වෙන අවස්ථාව දක්වෙන විදුලි පන්දම කුමක් ද?


(1)


(2)


(3)

53. පැළ ලබා ගැනීම සඳහා සුදුසු බීජයක තිබිය යුතු ලක්ෂණ අතරට අදාළ නොවන්නේ කුමක් ද?
(1) බීජ හොඳින් මෝරා තිබීම.
(2) බීජ ජලයට දැමූ පසු යටට ගිලී යෑම
(3) බීජ හොඳින් වේලීම සිදු නොකිරීම.

54. වී වගාවට හානි කරන සතෙකි.
(1) පළතුරු මැස්සා (2) කීඩෑවා (3) මී මැස්සා

55. 
රූපයේ සඳහන් තරු රටාව වන්නේ කුමක් ද?
(1) මහා වළසා
(2) දඩයක්කාරයා
(3) කුඩා වළසා

56. 
රූපයේ දක්වෙන ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමට දයක වූ චරිතය වන්නේ කවරෙකු ද?
(1) ආචාර්ය ටී.බී. ජයා
(2) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි
(3) ඕල්කට් තුමා

57. කන්තලේ වැව පිහිටා ඇති පළාත වන්නේ කුමක් ද?
(1) උතුරු මැද පළාත (2) වයඹ පළාත (3) උතුරු පළාත

58. කෙනෙකු පාර මාරු වීමේදී සිදුවිය යුතු නිවැරදි පියවරක් වන්නේ මින් කුමක් ද?
(1) වම් පැත්ත බලා පසුව දකුණු පැත්ත බලා නැවත වම් පැත්ත බලා පාර මාරුවීම.
(2) දකුණු පැත්ත බලා පසුව වම් පැත්ත බලා නැවත දකුණු පැත්ත බලා පාර මාරුවීම.
(3) දකුණු පැත්ත බලා වම් පැත්ත බලා පාර මාරුවීම.

59. පාසල පැවැත්වෙන දහවල් කාලයේදී පාසලේ ගුරුවරුන්ගේ රැස්වීමක් පැවැත්වීමට විදුහල්පතිතුමාට අවශ්‍යව ඇත. මෙහිදී ඔහු යොදා ගත යුතු ඉක්මන් හා ප්‍රායෝගික පහසුම ක්‍රමවේදය කුමක් ද?
(1) කාර්යාල සේවකයෙකු ලවා පන්ති මට්ටමින් අදාළ රැස්වීම පිළිබඳ දැනුවත් කිරීම.
(2) ගුරුවරුන්ට දුරකථන ඇමතුම් ලබා දෙමින් අදාළ රැස්වීම පිළිබඳ දැනුවත් කිරීම.
(3) පාසලේ ශබ්ද විකාශන යන්ත්‍රය මගින් අදාළ පණිවිඩය ගුරුවරුන්ට ලබාදීම.

60. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි සුන්දර දිවයිනකි. විවිධ ස්වභාවික පරිසරයන්, සම්පත් හා වෙනත් හේතූන් මත අප රට සුන්දරත්වයට පත් වී තිබේ. මේ බව සිහිකර ගනිමින් "මගේ රටේ සුන්දරත්වය" යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක ම වචන පහකට වඩා වැඩියෙන් තිබිය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

මගේ රටේ සුන්දරත්වය

**(i)** ..........................................................................................

..........................................................................................

**(ii)** ..........................................................................................

..........................................................................................

**(iii)** ..........................................................................................

..........................................................................................